

# අසෙනිය කුසුම

**නිරාෂ ගුණසේකර**



**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂින් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

**බැලුම් ඩාන්ස් එකකදී විතරයි අපට ඒ තරම්වත් ළං වෙන්න පුලුවන් උනේ...**

බොඳ බැලුම් නතර කර
පොඩිත්තක් නැලවෙන්න
කොයිතරම් බැලුම් දැවටුනත් අප වටේ

දරාගත නොහැකි
අර සමහර බැලුම් පිපිරේ
පිම්බුනු අපේ හුස්ම ද
අවකාශයට මුසුවේ

ලං ලං වෙවී - වඩ වඩා ලං නොවී
බැලුම් හිරකරගෙන රඟන රැඟුමේ
හීනයක පාටක් ය - මේ
බැලුම් අතරින් හෙලන බැලුමේ

නැවතුමක් ඇති නමුත් අත ලඟම
දිනාගත හැකිය
අපට
මේ මොහොත
පුපුරවා නොගෙන රැඳෙන - නොරැඳෙන
බැලුම
තබා රඟමු ද එක දිගට
අපිව රඳවන බැලුම?

*(කවියේ අක්ෂර වින්‍යාසය න/ණ, ල/ළ, ශ/ෂ භේද නොසලකා, කතුවරයාගේ අභිමතය පරිදි තබා ඇත.)*

**දමිත් උදයංග දහනායක**
'තෙමී තෙමීම මම' කාව්‍ය සංග්‍රහය 2014

ගිය අවුරුද්දේ එළිදුටු කවි පොත් අතරින් මා ඇස ගැටුණු සුවිශේෂී පොතකි මේ. එහි අන්තර්ගත කිසිදු කවියකට මාතෘකා නැත. නමුදු මුලු කෘතියම 'ප්‍රේමය' නම් පොදු මාතෘකාවකට කැටිවී ඇත. දලුලන ප්‍රේමයක් ගැන අසීමිත බලාපොරොත්තු හා සිහින දකිනා යෞවනත්වය මැනවින් විදාපාන බොහෝ කවි අතරින් 'බැලුම් නැටුමක්' ගැන කියැවෙන ඉහත කවිය එක පැහැර මා සිත් ගත්තේය. ඒ එහි ගැබ්වුණු නැවුම් බවත්, වචන හෝ සංකේතවල වාච්‍යාර්ථ ඉක්මවා බහුවිධ අරුත් නංවමින් කිසියම් හෘදයග්‍රාහී මානයකට අපව කැඳවාගෙන යෑමත් හේතුවෙනි.

නූතන සංස්කෘතික සමාජ වපසරියේ අලුත්ම විලාසිතා අංගයක් බඳු දෙයකි ඉහත කියනා 'බැලුම් නැටුම'. සාදයක් අතරතුර, කාන්තාවක් හා පිරිමියකු අතර සිදුවන මෙකී ආලිංගනය අපූරුය. කාන්තා-පිරිමි යුගල වශයෙන් යුවල කිහිපයක් මේ නැටුමට සහභාගී වේ. ඔවුන් තරගයට නර්තනයේ යෙදුණද එයද සිදුවන්නේ එක්තරා කොන්දේසියකට යටත්වය. ඔවුන්ගේ සිරුරු මැදින් පුම්බන ලද බැලුමක් රන්දවන අතර, උන් උන් නර්තනයේ යෙදිය යුතු වන්නේ ඒ බැලුම බිම වට්ටා නොගනිමිනි.
එය අතිශය සුන්දර අත්දැකීමක් බව නොකිවයුතු නොවේ. තරුණ ජවයෙන් නර්තනයට ඉදිරිපත් වන දෙදෙනා අතර ඇත්තේ බැලුමක වෙනසකි. සමහර විට ඒ 'බැලුම' විටෙක 'රබර් බැලුම' කි. අනෙක් විට නෙතගින් හෙළන බැලුමකි. දෙකෙන් කෝක වුවත් ඔවුනොවුන් අතර පරතරය ඉතා අවම ලෙස නඩත්තුවෙමින් නර්තනය දිගින් දිගටම සිදුවිය යුතුය.

අප කතකයාගේ අත්දැකීමද එවැන්නකි. ඔහු මෙම සොඳුරු මොහොත උදාවන තෙක් පස් මහ බැලුම් ලමින් ඉන්නට ඇත. නර්තන අවකාශ පරිධියේ සිටිනා දහසකුත් බැලුම් ඔවුනොවුන් වෙත වැටෙන ඒ මොහොතේ මොහු හා නැටුමට සහභාගීවන යුවතිය කෙරේ ඔහුට ඇත්තේ බොඳ බැලුමකි. මන්ද ඔවුනොවුන්ගේ ඇස් තෙත්ය. හේතු අපි නොදනිමු. ඇහිපිල්ලන් සැලෙන්නේ වචන මතුවන්න ඉඩ හසර නොතබමිනි. ඔහුගේ සිත වේගයෙන් දෙගිඩියාවෙන් සැලෙනු ඇත. ඇයගේ පපුවට රබර් බැලුමේ එක් අඩක් කිටි කිටියේ සිරවී ඇති අතර අනෙක් අඩට වාරුව අප කතකයාගේ ගැහෙන පපුවෙනි. උනුන් එකම කේන්ද්‍රයක් වෙත තම පපු තෙරපමින් අඛණ්ඩ නර්තනයේ යෙදිය යුතුය. පරාජය නොවී සිටීමට නම් දෙදෙනාම එකම අරමුණක සිටිය යුතු වේ. මේ අප කතකයා මෙවැනි අත්දැකීමකට මුහුණ දුන් පළමු අවස්ථාව විය හැක. ඔහුගේ ඇස් බොඳ කළ, එක් කාරණාවක් වනුයේ ඒ ලජ්ජාශීලී බව විය හැක. නමුත් ඔහුම කියනා පරිදි ඒ යුවතිය කෙරේ ඒ තරමට හෝ ළං වන්න ඔහුට හැකි වුණේ මේ කියන 'බැලුම් නැටුමේ' පිහිටෙනි. අවට රත් ඇස් වල බැලුම් වහ වහා උන් වෙත යොමුවේ; නිවේ; දැල්වේ. නර්තනය වඩ වඩා උත්කර්ෂවත්ව සිදුවේ.

ඒ අතරතුර තවත් බෝ දෑ සිදුවේ. බොඳ දෑස් වලින් වුණත් අප තරුණයාගේ දෑසට ඒ දසුන් ග්‍රහණය වේ. ඇතැම් නර්තන යුවලක් පමණට වඩා තෙරපීමෙන් බැලුම් තැන තැන පිපිරී යයි. ඒ ඉක්මන් හදිස්සිය විය හැකිය. නැත්නම් ඒ මොහොතේ ඒ අප්‍රමාණ ප්‍රහර්ෂය දරාගත නොහැකිවය. අපගේ කතා නායකයාද තම නර්තන සහකාරිය සමග වැරෙන් හුස්ම අල්ලගෙන පපු කුහර පුම්බාගෙන දිගටම නර්තනයේ යෙදේ. බැලුම බිම වට්ටගන්නට ඔවුනට අවසර නැත. එසේ වුවහොත් තරගයෙන් පරාජය සිදුවනවා පමණක් නොව, ලැබී ඇති වටිනා අවස්ථාව අහිමිවීම ඊටත් වඩා ලොකු පරාජයක් ජීවිතයට ගෙන දෙන්නකි. ඒ අතර මැද්දේ ඔවුනොවුන් ගේ හිර කරගත් පපු තුළින් පිම්බුණු හුස්ම පොද පිටවී සිය ගණනක් සෙනග පිරි අවකාශයේ දියවී යයි. අවිහිංසක යොවුන් ප්‍රේමයක කොටස්කාරියක් කරගන්න තතනන රුවකට, නර්තන සහකරුවෙකු ලෙස මේ තරමින් හෝ කිට්ටු වී සුසුම් උණුසුම් විඳුමම ඔහු ලබන අවිහිංසක දිනුමක් නොවන්නේද?

බැලුම තරව රඳවා ගැනීමට නම් වඩ වඩා ළං වෙවී නර්තනය කළ යුතු වුවද, එයත් ගණනටය. පමණට වඩා පීඩනය උන් උන් වෙත එල්ල කරගැනීම තුළින් බැලුමත්, සිහිනත් දෙකම එකවිට පුපුරා යා හැක. එය සීරුවට, පරෙස්සමට නඩත්තු කළ යුතු සිහිනයකි. ඒ බලාපොරොත්තු අතරින්, රැඟුම් අතරින් උන් උන් කෙරේ අඩ අඳුරේ හෙළනා බැලුම, සැබෑවටම සිහිනයක් බඳුය. නා නා වර්ණයෙන් දිදුලන විදුලි එළි මැද ඒ නෙත් බැලුම් සිහිනයක පාටින්ම දිදුලන්නේය.

නර්තනය නිමාවෙන්න තව වැඩි වේලා නොමැත. ඔවුන් පටන් ගත් පරිදි අතරමග කිසිවක් අත නොහැර දිගටම නර්තනයේ යෙදිය යුතුය. නර්තනයට අමතරව අප තරුණයාගේ සිත එකම සිතිවිලි ජාලාවක නන්නත්තාර වී ඇති සැටියෙකි. ඔහුට මේ මොහොත ඉක්මනින් නිමා කරගත යුතු නැත. යන්තමට වත්තම් කරගත් රැඳෙන නොරැඳෙන බැලුමත් සමග ළං වී සිටීම තුළ ඔහුට ඒ මොහොත දිනා ගත හැක. තරගය දිනීමෙන් ඔබ්බට ගොස්, මෙතුවක් කල් හේ පුල පුලා බලා සිටි ඒ අති සුන්දර මොහොත ඔහුට ලැබෙනා සැබෑ දිනුමක් වේ දැයි අප නොදනිමු.

අවසානයේ ඔහු ප්‍රාර්ථනා කරන්නේ ඔවුන් රඳවන 'බැලුම' පුපුරවා නොගෙන ඒ මොහොත තුළ හැකි තරම් ජීවත් වන්නටයි. ඔවුන් අතර පොඩි ඉඩ අවුරන පිපිරීමට ආසන්න රබර් බැලුමත්, මන්ද අඳුරේ ඔවුනොවුන්ගේ නෙත්වලින් එකිනෙකා වෙත නිරුත්සාහිකව වැටෙනා කෝල ඇස් බැලුමත්, නර්තන පරිධියෙන් උන් උන් වෙත කඩා පනින දහසකුත් බැලුම් අතරේත් දෝලනය වන ඒ රාත්‍රියේ අවසානය කෙබඳු වූයේ දැයි අපි නොදනිමු. රබර් බැලුම විසින් තනා දුන් ඉඩත්, එය විසින්ම අවුරා ඇති ඉඩත් අපූරුවට යොදා ගනිමින් ගොඩ නගා ඇති මේ කවිය අතිශය හෘදයග්‍රාහී වන අතර, දහසක් බැලුම් අතරේ ඔහු සිත ගත් එකම එක බැලුම පුපුරා නොගොස්, පැතූ ජයග්‍රහණය උදාවූයේ දැයි අපි නොදනිමු. එසේ නොමැතිනම් තරගයෙන් අනතුරුව හීලියම් බැලුමක් සේ සීරුවට හිස් අවකාශයට මිදී, දුර ඈත අහසක පෙනී නොපෙනී ගියාවත් දැයි නොදනිමු.

